කාර්යාලය
அலுவலகம்
Office: 011-2186055

ලේකම්
செயலாளர்
Secretary: 011-2186057

ෆැක්ස්
பெக்ஸ்
Fax: 011-2187249


**කාන්තා හා ළමා සංවර්ධන,පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය**

மகளிர் மற்றும் சிறுவர் அபிவிருத்தி, முன்பள்ளி மற்றும் ஆரம்பக் கல்வி, அறநெறிப் பாடசாலைகள், கல்விச் சேவைகள் மற்றும் பாடசாலைகள் உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சு

State Ministry of Women and Child Development, Pre-School & Primary Education, School Infrastructure & Education Services


ඊමේල්/மின் தபால் / Email: secretary@childwomenmin.gov.lk
වෙබ් අඩවිය/ இணையத்தளம் / Website: www.childwomenmin.gov.lk


මගේ අංකය
எனது இல.
My No. MWCA/2/5/4/4/2/5/ II වෙළුම

ඔබේ අංකය.
உமது இல.
Your No.

දිනය.
திகதி.
Date 2020.10.13

දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය</u>**

<u>මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2021</u>

ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2020 අනුව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්තව දැනට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් - 2021 සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සියලුම අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රය (ඇමුණුම් 01) අනුව ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඔබගේ නිර්දේශ සමග **2020** දෙසැම්බර් **03** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත එවීමට සැලැස්විය යුතුය.

03. **<u>ස්ථාන මාරු සඳහා නිලධරයන්ගේ සුදුසුකම් තීරණය කිරීමේ පොදු ප්‍රතිපත්ති:</u>**

I. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

II. <u>තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02කට අඩු සේවා කාලයක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.</u>

III. <u>තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියලුම නිලධරයන් අනිවාර්යෙන්ම ස්ථාන මාරුවීම් අයදුම් කළ යුතුය.</u>

IV. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියලුම නිලධරයන් ස්ථාන මාරුවීම් ඉල්ලීම් නොකළ ද මෙම ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

V. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධරයන් ද අනිවාර්යෙන්ම ස්ථාන මාරුවීම් අයදුම් කළ යුතුය.

VI. ස්ථාන මාරුවීමට අපේක්ෂාවෙන් සිටින සහ මින් පෙර කිසිදු ස්ථාන මාරුවීමක් ලබා නොමැති නිලධරයන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙනු ලැබේ.

VII. නිලධාරීන් ඉල්ලුම් කර ඇති සේවා ස්ථානයන් ප්‍රමුඛතා පරිදි ලබා දීමට සලකා බලනු ලබන නමුත්, ඉල්ලුම් කර නොමැති සේවා ස්ථානයකට වුවද ස්ථාන මාරු ලබා දිය හැකිය.

VIII. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලැබෙන අභියාචනා සලකා බලනු නොලැබේ.

04. අදාළ නිලධාරින්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී එහි සඳහන් තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ඔබගේ නිර්දේශය සමග ඉදිරිපත් කරන්නේ නම් මැනවි.

05. ස්ථාන මාරුවීම් අයදුම්පත් ඉදිරිපත් කිරීමට මෙම අමාත්‍යාංශය මගින් ඔබ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි. මෙම තොරතුරු අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත. (http://www.childwomenmin.gov.lk)

එම්.එච්.ජී. බණ්ඩාර

අතිරේක ලේකම් (පාලන)

අත්/කළේ : කේ.එම්.එස්.ඩී. ජයසේකර

ලේකම්

ඇමුණුම 01

## 2021 - වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අයදුම්පත

## මුල් ළමාවිය සංවර්ධන සහකාර

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. සම්පූර්ණ නම :- | | | |
| 02. මුලකුරු සමඟ නම :- | | | |
| 03. උපන් දිනය:- | 04. වයස :-2020.12.31 දිනට | 05. ජාතික හැඳුනුම්පත් අංකය:- | 06.ස්ත්‍රී / පුරුෂ භාවය :- |

| | | |
|---|---|---|
| 07. ස්ථිර ලිපිනය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- | 08. තාවකාලික ලිපිනය :- | 09. දුරකථන අංකය :-<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- |
| 10. විවාහක / අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම:- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- |
| 13. දරුවන් ගණන :- | 14. ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසැල:- |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 16. වර්තමාන සේවා ස්ථානය :- | 17. සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය :- |
| 18. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :- | 19. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :- |
| 20. දැනට පදිංචි ස්ථානයේ සිට වර්තමාන සේවා ස්ථානයට ඇති දුර :- | |

| 21. පූර්ව සේවා විස්තර * | | සේවා ස්ථානය | තනතුර | සේවා කාලය | | එවකට පදිංචි ස්ථානයේ සිට දුර |
|---|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා | |
| | 1 | | | | | |
| | 2 | | | | | |
| | 3 | | | | | |
| | 4 | | | | | |
| | 5 | | | | | |

* ඉඩ ප්‍රමාණවත් නොවේ නම් අමතර කොළයක් අමුණන්න

ඇ. <u>ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳ තොරතුරු</u> (ප්‍රමුඛතා අනුපිළිවෙලින් සඳහන් කරන්න)

| අනු අංකය | ඉල්ලුම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | එම සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය | පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර (කි.මී.) (යාමට පමණි) |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

දිනය :- .............................

.............................
අයදුම්කරුගේ අත්සන

අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :- .............................

..............................................
දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම්ගේ
අත්සන සහ නිල මුද්‍රාව